රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

15 | S | I,II

පළමු වාර පරීක්ෂණය - 2020

First Term Test - 2020

ක්‍රිස්තු ධර්මය I, II

Christianity I, II

කාලය පැය තුනයි.

නම / අංකය : ..........................................................................

10 ශ්‍රේණිය

## I කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* I කොටසේ එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙකක් හිමිවේ.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) මෙසියස් වහන්සේ බෙත්ලෙහෙම් උපදින බව කී දිවැසිවරයා කවුද?
(i) යෙසායා (ii) මීකා (iii) ජෙරමියා (iv) ආමෝස්

(02) සෙකරියස් අයත් වූ පේරුව කුමක්ද?
(i) දාවිත්ගේ (ii) ආරොන්ගේ (iii) අබියාගේ (iv) හෙරෝද්ගේ

(03) සෙකරියස් ගොළුව සිටි කාලය තුළදී ඔහු තුළ වර්ධනය වූ ලක්ෂණ
(i) අකීකරුකම හා අවිශ්වාසය (ii) දේවභය හා ස්තුතිවන්තභාවය
(iii) ප්‍රේමය හා සහෝදරත්වය (iv) විශ්වාසය හා කරුණාව

(04) යුදෙව් චාරිත්‍ර අනුව ජේසුස් වහන්සේ කැප කරනු ලැබුවේ දින කීයකට පසුවද?
(i) දින 8 යි. (ii) දින 14 යි. (iii) දින 20 යි. (iv) දින 40 යි.

(05) තරුණ අවධියේ සිටම දිවැසිවර එලියාගේ ආත්මානුභාවයෙන් ක්‍රියා කළේ,
(i) ජේසුස් වහන්සේ ය. (ii) සිමියොන් ය. (iii) ස්නාවක ජොහාන්ය. (iv) ජෙරමියා ය.

(06) ජේසුස් යන්නෙහි අර්ථය වන්නේ,
(i) දෙවියන් වහන්සේ මුදන සේක. (ii) දෙවියන් වහන්සේ අප සමගයි.
(iii) දෙවියන් වහන්සේ අප සරණයි. (iv) දෙවියන් වහන්සේගේ දාසයාය.

(07) මරියතුමියගේ ජීවිතාදර්ශය අගය කරන ඔබ,
(i) අවදානම් සහිත තීරණ නොගත යුතුය.
(ii) සමාජ ප්‍රතිචාරය කුමක් වුවත් නිවැරදි දේ කළ යුතුය.
(iii) ප්‍රශ්න ඉදිරියේ කැළඹීමට පත්විය යුතුය.
(iv) විශේෂ පුවත් ආරංචි වූ විට උදම් ඇනිය යුතුය.

(08) සැත්තෑ දෙනාගේ ධර්මදූත සේවය පිළිබඳ උදම් අනමින් පැමිණි ගෝලයන්ට ජේසුස් වහන්සේ පැවසුවේ ප්‍රීති වියයුත්තේ කුමක් සඳහා කියාද?
(i) සේවය සාර්ථක වූ බැවින් (ii) ස්වර්ගයෙහි නම ලියා ඇති බැවින්
(iii) සේවයට කැඳවනු ලැබූ නිසා (iv) සේවයේ බාධක ජයගත් නිසා.

(09) ජේසුස් වහන්සේ සිය ශ්‍රාවක කණ්ඩායමට තෝරාගත් අල්පේවුස්ගේ පුත්‍රයා කවුද?
(i) සීමොන් ය. (ii) ජොහාන් ය. (iii) ජාකොබ් ය. (iv) අන්ඩෘ ය.

(10) කිතුනු පවුලක් තුළ තිබිය යුතු විශේෂත්වයකි,
(i) ප්‍රේමය හා වගකීම් බෙදා ගැනීම. (ii) දෙමව්පියන් දරුවන් කෙරේ දක්වන දැඩි පාලනය.
(iii) දේව වචනය වාචිකව ප්‍රකාශ කිරීම. (iv) සියලුදෙනාම මුදල් ඉපයීමට දරන වෑයම.

(11) "ස්වාමීනි මා ඔබගේ උපකරණයක් කරගත මැනව" මෙසේ සඳහන් වන්නේ,
(i) ශු. ෆ්‍රැන්සිස්තුමාගේ යැදුමෙහි (ii) ස්වාමීන්ගේ යැදුමෙහි.
(iii) ශු. අන්තෝනිතුමාගේ යැදුමෙහි (iv) ගෙත්සෙමනි යාච්ඤාවෙහි.

(12) කිතුනුවකුගේ යුද්ධායුධ අතරින් එකක් නොවන්නේ,
(i) සත්‍යය නැමති ඉඟපටිය. (ii) දමිටුකම නැමති ළය වැස්ම
(iii) දේව වචනය නැමති දුන්න. (iv) ඇදහිල්ල නැමති පලිහ

(13) ඩැරල් දේවගැතිතුමා උපන්නේ,
(i) 1872 (ii) 1896 (iii) 1906 (iv) 1900

(14) මුල් කිතුනු සභාවේ ආරම්භය සිදුවූයේ,
(i) රෝමයේ ය. (ii) පලස්තීනයේ (iii) සිරියාවේ (iv) මිසරයේ

(15) ශුද්ධාත්ම බලයෙන් නැවත ජීවිතය ලද්දේ,
(i) සාකේවුස් (ii) සාවුල් (iii) මාර්තා (iv) දෝර්කස්

(16) ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ගැන අනාවැකි කී දිවැසිවරයා,
(i) යෙසොයා (ii) මලාකි (iii) එලියා (iv) ජෙරමියා

(17) "එතුමා කලකිරෙන්නේවත් අධෛර්යයට පත්වන්නේවත් නැත." මෙයින් ජේසුස් වහන්සේගේ සේවය,
(i) බලය මත ක්‍රියාකරන බව පෙන්වයි.
(ii) අභියෝග හමුවේ නොසැලී සිටින බව පෙන්වයි.
(iii) කලකිරෙන මුත් නොසැලෙන බව පෙන්වයි.
(iv) අභියෝග සාකච්ඡාවෙන් ජයගන්නා බව පෙන්වයි.

(18) කිතුනු අප කටුක අත්දැකීම් හරහා ගමන් කරන විට ගතයුතු වඩාත් සුදුසු පියවර,
(i) දයාවෙන් හා කරුණාවෙන් ක්‍රියා කළයුතුය.
(ii) ප්‍රඥාවෙන් හා බලයෙන් ක්‍රියාකළ යුතුය.
(iii) ඉවසීමෙන් හා ධෛර්යයෙන් ක්‍රියා කළ යුතුය.
(iv) දක්ෂතාවයෙන් හා බලයෙන් ක්‍රියා කළයුතුය.

(19) ජේසුස් වහන්සේ ලෝකයේ පව් දුරලන දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයා ලෙස හඳුන්වා දුන්නේ,
(i) පේදුරු
(ii) ස්නාවක ජොහාන්
(iii) මෝසෙස්
(iv) යෙසායා

(20) ජේසුස් වහන්සේගේ සේවයේ ආදර්ශය ලබන අප,
(i) සේවය ලැබීමට යොමුවිය යුතුය.
(ii) බලය ක්‍රියාත්මක කළයුතුය.
(iii) අණසක පැතිරවිය යුතුය.
(iv) සේවය කිරීමට යොමුවිය යුතුය.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

I. ජුදා සමාජයේ දෙවියන් වහන්සේගේ වැඩසිටීම සංකේතවත් කළේ කුමකින්ද?
II. කිතුනු දරුවකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න.
III. සණ්ඩුරු දේශයේ විසූවන්ට ආලෝකයක් වූයේ කවුද?
IV. ස්නාවක ජොහාන්තුමාගේ ‘‘මග පිළියෙල කිරීමේ’’ සේවය ගැන අනාවැකි පැවසූයේ කවුද?
V. ‘‘මෙසියස්’’ යන වචනයේ අර්ථය ලියන්න.
VI. ආබ්‍රහම්ගේ පුත්‍රයෙකු හා දියණියක ලෙස නම් කළ දෙදෙනා කවුද?
VII. ජුදෙව් සමාජයේ ප්‍රතික්ෂේපයට ලක්වූ ජන කණ්ඩායම් දෙකක් ලියන්න.
VIII. ජේසුස් වහන්සේ තෝරා ගත් මුල් ශ්‍රාවකයන් දෙදෙනෙක් නම් කරන්න.
IX. ගෙනසරත් විල හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න.
X. ජේසුස් වහන්සේ වෙනුවෙන් දෙමව්පියන් ඉටුකළ ජුදෙව් චාරිත්‍ර දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) .

I. විශේෂ උපත් ගැන සුභාරංචි ලැබූවන් නම් කරන්න. (ලකුණු 02)
II. ඔවුන් එම සුභාරංචි වලට දැක්වූ ප්‍රතිචාර වෙන වෙන ම ලියන්න. (ලකුණු 03)
III. කිතුනු ඔබට ලැබෙන දේව කැඳවීම් දෙකක් නම් කර ඔබ එයට ප්‍රතිචාර දක්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) .

I. සෙකරියන්ගේ ප්‍රශංසා ගීයෙහි ස්නාවක ජොහාන් ගැන අවධාරණය කෙරෙන සත්‍යතා දෙකක් ලියන්න. (ලකුණු 02)
II. ස්නාවක ජොහාන්තුමා සරළ ජීවිතයක් ගතකළ බව පෙන්වීමට උදාහරණ තුනක් ලියන්න. (ලකුණු 03)
III. ඔබ අවට සිටින පීඩනයට හා අසහනයට පත්වූවන් වෙනුවෙන් ඔබට කළ හැකි දේ යෝජනා කරන්න. (ලකුණු 05)

(04) .

I. ‘‘දිවැසිවරයා’’ යනු කවරෙක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)
II. කිතු උපත ගැන කියවෙන ඔබ ඉගෙනගත් දිවැස් වැකි දෙකක් ලියන්න. (ලකුණු 03)
III. වර්තමාන සමාජයේ දිවැසිවරු ලෙස පෙනීසිටින්නේ කවුද? ඔවුගෙන් වන සේවය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05)

I. ප්‍රේරිත යන වචනයෙහි අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 02)
II. ධර්මදූත චාරිකාවලින් ඇතිවූ ප්‍රතිඵල තුනක් ලියන්න. (ලකුණු 03)
III. ධර්මදූත සේවයට පිටත්කර යැවීමේදී ජේසුස් වහන්සේ ලබාදුන් උපදෙස් තුනක් ලියා ඒ එක් එක් කරුණෙහි වැදගත්කම ඔබ දකින්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06)

I. ජේසුස් වහන්සේ තම දෙමව්පියන් සමග ජෙරුසලම් දේව මාළිගයට ගියේ ඇයි? (ලකුණු 02)
II. උන්වහන්සේ හා තම මෑණියන් අතර වූ සංවාදය ලියන්න. (ලකුණු 03)
III. එම සංවාදය ඇසුරින් අපට අවධාරණය කරන්නේ කුමක්ද? දේව රාජ්‍යයේ දියුණුව සඳහා කිතුනු දරුවකු වන ඔබගේ වගකීම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) පහත මාතෘකා අතරින් දෙකක් ගැන කෙටි සටහනක් ලියන්න.

I. ස්නාවක ජොහාන්තුමා සේවයට සූදානම් වීම.

II. ජේසු බිළිඳු වෙනුවෙන් ඉටු කළ පුදෙව් චාරිත්‍ර

III. කිතුනු ජීවිත පැවැත්ම.

(ලකුණු 2 x 5 = 10)